# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2159/16 - 2020 ජනවාරි මස 22 වැනි බදාදා - 2020.01.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ඒ/00/1/14/9

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති**

**ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

1. ගරු උපාලි අබේරත්න මැතිතුමා
   විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්වයකාර
2. ගරු දයා චන්ද්‍රසිරි ජයතිලක මැතිතුමා
   විශ්‍රාමික අභියාචනාධිකරණ විනිශ්වයකාර
3. චන්ද්‍රා ප්‍රනාන්දු මැතිතුමා
   විශ්‍රාමික පොලිස්පති

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

පිළිවෙලින් 2015 ජනවාරි මාසයේ දී සහ අගෝස්තු මාසයේ දී පැවති ජනාධිපතිවරණයට සහ / හෝ මහ මැතිවරණයට පෙර නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන්හි මෙන්ම පොලිස් සේවයෙහි සාමාජිකයින් 2015 ජනවාරි මස 08 වැනි දිනෙන් ඇරඹී, 2019 නොවැම්බර් මස 16 වැනි දිනෙන් අවසන් වූ කාල සීමාව තුළදී දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කරනු ලැබී යැයි වාර්තා කරනු ලැබීම හේතුවෙන්, ඊට අදාළව පරීක්ෂණ හා විමර්ශන කොට වාර්තා කිරීම පිණිස, සංශෝධිත පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 වන අධිකාරය වන) 2 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ 2020 ක් වූ ජනවාරි මස 09 වන දින නිකුත් කරන ලද අධිකාරී පත්‍රයක් මගින් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවා ඇති හෙයින් ද,



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

එම අධිකාරී පත්‍රයේ සඳහන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය සහ / හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය යන ආයතනයන්ට අමතරව, එම අධිකාරී පත්‍රයේ සඳහන් (අ) සිට (ඇ) දක්වා කරුණු සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ද ඇතුළත් විය යුතු බවට මා වෙත නියෝජනයන් ලැබී ඇති හෙයින් ද,

තවද එබඳු දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කිරීමේ ක්‍රියාවලීන් එකී සිදුවුණැයි කියනු ලබන දේශපාලනමය වශයෙන් පළිගැනීමට ලක් කිරීමේ කාල සීමාව තුළ අග්‍රාමාත්‍යවරයා ගේ විෂයපථය යටතේ ක්‍රියාත්මක දූෂණ විරෝධී කටයුතු පිළිබඳව ක්‍රියා කරන විශේෂ ඒකකයක් හරහා දේශපාලන පළිගැනීම් ක්‍රියාවලිය මෙහෙයවනු ලැබූ බැව්ද, පූර්වෝක්ත කාල සීමාව තුළදී එකී දූෂණ විරෝධී ඒකකය විසින්, විමර්ශනයට භාජනය කළ යුත්තේ කවර තැනැත්තෙකු ද යන වග පළමුව තීරණය කොට, අනතුරුව පැමිණිලි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකා පොලීසියේ මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය සහ / හෝ ශ්‍රී ලංකා පොලීසියේ පොලිස් විශේෂ විමර්ශන ඒකකය, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හෝ වෙනත් කිසියම් ආයතනයක් වෙත යොමු කරනු ලැබූ බවට චෝදනා කරනු ලැබ ඇති හෙයින් ද,

එලෙස දේශපාලන බලපෑම් සහිත තුන්වන පාර්ශවයක මැදිහත්වීම් හේතුවෙන් යම් පාර්ශවයක් වෙත නීතිය පසිඳලීමේ දී හෝ යුක්තිය පසිඳලීමේ දී කිසියම් තැනැත්තෙකුට අගතියක් විය හැකි බැව් මෙන්ම ත්‍රිවිධ හමුදාවේ හා ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති පැමිණිලිවලට අදාළව උක්ත ආයතන කටයුතු කිරීමේ දී ජාතික ආරක්ෂාව පිළිබඳ අහිතකර බලපෑමක් ඇති බවද, මාගේ අවධානයට ලක්කොට ඇති හෙයින් ද,

උක්ත අධිකාරී පත්‍රයේ (අ) සිට (ඇ) දක්වා වන කරුණු වල සඳහන් ආයතනවලට අමතරව, එහි අදාළ සෑම ස්ථානයකටම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව යන්නත්, එසේම පරීක්ෂා කොට තොරතුරු ලබා ගැනීම පිණිස (අ) සිට (ඇ) දක්වා ඇති කරුණු වලට අමතරව, පහත පරිදි, එනම්,

(ඉ) 2015 ජනවාරි මස 08 වන දිනෙන් ඇරඹී 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළදී උක්ත ආයතන වෙත ඉදිරිපත්වී ඇති පැමිණිලි අතරින් මෙම අධිකාරී පත්‍රයේ සඳහන් උක්ත දූෂණ විරෝධී ඒකකය විසින් විමර්ශනයට භාජනය කළ යුත්තේ කවර තැනැත්තෙකු ද යන වග පළමුව තීරණය කොට අනතුරුව විමර්ශන ආරම්භ කළේ යැයි සැළකෙන සියළු පැමිණිලි හා ත්‍රිවිධ හමුදාවේ සහ ශ්‍රී ලංකා පොලීසියේ නිලධාරීන් සම්බන්ධයෙන් ඉදිරිපත්වී ඇති ජාතික ආරක්ෂාවට බලපානු ලබන පැමිණිලි කවරේදැයි සොයා බලා, එකී තුන්වන පාර්ශවයේ බලපෑම් හේතුවෙන් නීතිය පසිඳලීමේ දී හෝ යුක්තිය පසිඳලීමේ දී යම් තැනැත්තෙකු අගතියට පත්වන්නේ යැයි සැළකෙන පරීක්ෂණ, විමර්ශන හෝ නීති කටයුතු වලදී, ත්‍රිවිධ හමුදාව හා ශ්‍රී ලංකා පොලීසිය හා රාජ්‍ය සේවය සම්බන්ධයෙන් ජාතික ආරක්ෂාව කෙරෙහි බලපාන පරීක්ෂණ, විමර්ශන හෝ නීති කටයුතු වලදී සහ / හෝ අන් කවර වූ හෝ ආකාරයකින් අගතියට පත්වී ඇතැයි සලකනු ලබන අවස්ථාවලදී එලෙස අගතියට පත්වීම හෝ ජාතික ආරක්ෂාවට හා රාජ්‍ය සේවාවන්ට වන අහිතකර බලපෑම වැළැක්වීමට අවශ්‍ය ක්ෂණික පියවර ගැනීම;

යන්නත් මෙයින් ඇතුළත් කරමි.

ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමර්ථ්‍යය හා පක්ෂපාතීත්වය ගැන මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත අධිකාර පත්‍රය මගින් පිහිටුවනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවේ ඉහතින් දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු පිණිස අවශ්‍ය විය හැකි සියළුම පියවර ගන්නා මෙන් ඔබතුමන්ලාට මම මෙයින් නියම කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විස්සක් වූ ජනවාරි මස 22 වැනි දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

**පී.බී. ජයසුන්දර**
ජනාධිපති ලේකම්

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.